





ශ්‍රී ලාංකික සාහිත්‍ය කරුවන්, රසිකයන්, පාඨකයන් සියලු දෙනා රාජ්‍ය අනුග්‍රහය ද සහිතව සෑම වර්ෂයකම සැප්තැම්බර් මාසය සාහිත්‍ය මාසය ලෙස සැමරීමට යොමු වන බව අපි දනිමු. එම මාසය පුරාම විශාල වශයෙන් පොත්පත් ප්‍රකාශයට පත් වීම, ඊට පෙර වසරේ ප්‍රකාශිත පොත් අතුරෙන් හොඳ ඒවා යයි තීරණය කෙරෙන කෘතීන්ට සම්මාන පිරිනැමීම, සාහිත්‍යයේ ප්‍රවර්ධනය සඳහා ඒ පිළිබඳ දේශන, ශාස්ත්‍රීය, සම්මන්ත්‍රණ, තරඟ ආදිය පැවැත්වීම යන මෙකී බොහෝ දේ සැප්තැම්බර් මාසය තුළදී මෙරට සිදු වන ඒවාය. ඒ අතර වෙනත් විශේෂ සිදුවීම් වන්නේ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය සමග පොත් සල්පිල් සහ ඒවාට අනුබද්ධව වෙනත් අංග ද ජනතාවගේ විනෝදාස්වාදය සඳහා පැවැත්වීමය.

ඉන් අනතුරුව උදා වන ඔක්තෝබර් මාසය ජාතික කියවීමේ මාසය ලෙස සමරනු ලැබෙන අතර එම කාල සීමාව තුළදී ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ මූලිකත්වයෙන් සිදු කෙරෙන වැඩසටහන් රාශියක් ද වෙයි. එමතු නොව ශ්‍රී ලංකාව පුරාම පාසල්වලත්, පුස්තකාලවල හා වෙනත් අධ්‍යාපන ආයතනවලත් කියවීමේ මාසය සැමරීම සඳහා කටයුතු යෙදෙනු ඇත. සාහිත්‍ය මාසය සමරමින් සිදු කරනු ලබන්නේ සාහිත්‍යයේ ප්‍රවර්ධනය සඳහා යෝග්‍ය වන විවිධ කටයුතු වන්නා සේම එයින් සිහිපත් කර දෙන කියවීමේ අවශ්‍යතාව හා වැදගත්කම ඔක්තෝබර් මාසය තුළදී යළි මතක් කර දීම මේ දක්වා ක්‍රියාවට නැංවෙන යහපත් දේය.

අපගේ ළමා වියේදී කුමාරොදය, කුමාර රචනය, හීන්සැරය, මඟුල්කෑම, හත්පණ ආදී පොත්පත් පාසලේදීත් ඉන් බැහැරවත් ඉතා උනන්දුවෙන් පරිහරණය කිරීමට අපි යොමු වීමු. එදා මෙදාතුර පොත්පත් රචනය, ප්‍රකාශනය මෙන්ම කියවීම ද සෑහෙන තරම් ඉදිරියට ගොස් ඇතැයි කීම අසත්‍යයක් නොවේ. කෙසේ නමුදු එදා සහ අද සැසඳීමේදී මෙහි තුන්වන අංශය, එනම් පොතපත කියවීම ප්‍රමාණවත් තරමින් වර්ධනය වී ඇද්දැයි යන්න පරෙස්සමෙන් විමසා බැලිය යුත්තක් වී ඇත. එදා බාල දරුදැරියනට පාසල් පොත්වලට අමතරව කියවීමට තිබුණේ සීමිත පොත් සංඛ්‍යාවක් වුවද අද දරුවනට දවස පුරා කියවුවත් කියවා අවසන් කළ නොහැකි තරම් පොත් ප්‍රකාශනයෙන් එළි දැක්වෙන නමුදු ඒවා කියවීමට පසුබට වන දරුවන් එසේ වන්නේ ඇයි ද යන්න සොයා බැලිය යුත්තකි.

ලේඛන මාධ්‍යයෙන්, මුද්‍රිත මාධ්‍යයෙන්, දරුවන් අතට පත් වන පොතපත පසෙක ලා ඔවුන් වෙනත් විකල්ප මාධ්‍ය වෙතට යොමු වන තත්වයක් අද උදා වී ඇත. පරිගණකයට අතිශය සමීප බවක් දක්වන ඔවුන් ඒ මගින් අන්තර්ජාලයට, විවිධ වෙබ් අඩවිවලට පිවිස තම දෙසවන් පමණක් නොව දෙනුවන් ද සන්තර්පණය කරවන වැඩසටහන්වලට යොමු වීම අද ප්‍රවණතාවක් වී ඇත. ඒ හැරුණ විට රූපවාහිනිය මගින් විකාශය වන විවිධ වූ වැදගත් මෙන්ම නොවැදගත් වැඩසටහන් ද අද දරුවන්ගේ මනෝලෝකය පෝෂණය කරමින් පවතී. මුද්‍රිත මාධ්‍යය, විද්‍යුත් මාධ්‍යය විසින් ගිලගනු ලැබ ඇතැයි කිවහොත් එය සම්පූර්ණයෙන් අසත්‍ය කියමනක් නොවේ. අතීතයේදී අප අතේ රැඳුණ ගල්ලෑල්ල සහ ගල්කූර වෙනුවට පසු කලෙකදී පෑන හා පැන්සල දරුවන්ගේ සුරත රැඳුණේ සංවර්ධනයේ ලක්ෂණ කියා පාමින් මිස පරිහානියක ලකුණු පෙන්වමින් නොවේ. එහෙත් අද වනවිට අපේ දරු පරපුර සිය අත්වල දරන ජංගම දුරකථනය හුදෙක් පණිවුඩ හා තොරතුරු හුවමාරුවට ඔබ්බෙන් විවිධාකාර අයහපත් දේට ද නොදැනුවත්වම මෙන් ඔවුන් යොමු කරවන භාණ්ඩයක් වී ඇත. එදා ඡායාරූපයක් ගැනීමට කැමරාවක් උරහිසේ එල්ලාගෙන ගිය කෙනකුට අද ඉතා කුඩා ජංගම දුරකථනයකින් එම අවශ්‍යතාව ද පහසුවෙන් පිරිමසාගත හැකිව ඇත.

එකල දරුවන්ගේ දැනුම වර්ධනය කරවා ලීමට පොතපත මිල දී ගෙනවුත් දුන් දෙමාපියෝ අද ඔවුන්ට තෑගි කරන්නේ 'ලැප්ටොප්' පරිගණකයක් හෝ 'අයිපෑඩ්' එකකි. මේවා මගින් තම අධ්‍යාපනයට අවශ්‍ය දැනුම සපයාගැනීමට අමතරව අපේ වත්මන් දරු පරපුර විවිධ යහපත් හා අයහපත් දේට යොමු වන අයුරු දැකගත හැකිය. පාසල් වේලාවෙන් පසුව දිවා ආහාරය ගෙන, මඳ වෙලාවක් සෙල්ලම් කොට, අතට පොතක් ගෙන කියවීමට යොමු වූ අපි අද අපේ බාල පරපුර දෙස බලා සිටින්නේ උතුරා යන සතුටක කෙළවර දුක්වේදනා දනවන හැඟීම් මාත්‍රයක් ද ඊට මුසු කරගනිමිනි.

ලොව පුරා දිනෙන් දින සිදු වන සංවර්ධනය තුළ, තාක්ෂණික දියුණුව වැදගත් කරුණක් ලෙස දකින්නට අපි මැලි නොවෙමු. එදා අප හෙමින් හෙමින් උගත් දෑ අද අපේ දරුවෝ ශීඝ්‍රයෙන් ග්‍රහණය කරගනිති. මේ සුබ ලකුණු අතර දිස් වන අසුබ ලකුණු ද අපගේ අවධානයට ලක් වී ඇත්තේය. පොතපත කියවීම දරුවන්ගේ දෛනික ජීවන රටාවෙන් ගිලිහී යන්නට පෙර එය සවිමත් කරගැනීමට බොහෝ දෙනා උත්සාහ දරන බව අපට පෙනේ. දරුවකුගේ උපන් දිනයට සෙල්ලම් තුවක්කුවක් හෝ බෝනික්කකු තෑගි දීමට එදා යොමු වූ වැඩිහිටියන්ට අද ඒ වෙනුවට පොතක් තෑගි දීමට යොමු වන ලෙස කෙරෙන ඉල්ලීම් හා මතක් කිරීම් ද අතරින් පතර හෝ අසන්නට ලැබේ. රාත්‍රි ආහාරයෙන් පසු නින්දට යෑමට පෙර පොඩි දරුවනට 'බෙඩ් ටයිම් ස්ටෝරීස්' කියවීම බොහෝ රටවල ක්‍රියාත්මක වන්නකි. ඒ අනුව අපි ද අපේ දරුවන්ට සතුට, විනෝදය සමග හරවත් යමක් කියවෙන පොතක් කියවා දරුවා නින්දට යැවීමට හුරු පුරුදු වී ඇත්තෙමු. දරුවකු තුළ පොතපත කියවීමේ රුචිය වඩවා ලීමට නම් කුඩා වියේ සිට ඔවුන් ඊට හුරු කරවිය යුතුය. පියාගේ හා මවගේ පොත් තබන කාමරයේම දරුවාගේ පොත්පත් තබන කුඩා රාක්කයක් තබා දීමට යොමු වන මව්පියන් ගැන අපි අසා ඇත්තෙමු.

පොතපත කියවීමට තම දරුවන් ප්‍රිය නොකරන බව කියමින් දුක් වන වැඩිහිටියන් මෙන්ම, දරුවන්ගේ එම ප්‍රවණතාවට ඉඩ දී ඔවුන් ඉල්ලා සිටින විකල්ප දේට හුරු කරවීමෙන් සෑහීමට පත් වන වැඩිහිටියෝ ද අද අපට හමු වන්නාහ. පොතපත කියවීම දරුවන්ට බල කරවා කළ නොහැකිය. එසේ කළ යුතු ද නැත. බාල වියේ මව හෝ පියා දරුවාට රස කරමින් කතන්දර කියවා දෙන විට එම හුරුව, පුරුද්ද දිගින් දිගටම දරුවන් වෙත රැඳීම බොහෝ විට සිදු වෙයි. එසේ වුවද ඒ අතරට විද්‍යුත් මාධ්‍යයේ හාස්කම් දක්වන අනෙකුත් භාණ්ඩ දරුවන් වෙත ළඟා වෙද්දී ඔවුන් ඇස්කන් පිනවන දේට වැඩියෙන් ඇදී යාම ද නොවැළැක්විය හැකිය.

පරිගණකය, අන්තර් ජාලය, 'ෆේස් බුක්' යනාදියට ඇදී සිටින අපේ දරුවන්ට පොත් කියවීමේ වැදගත්කම කෙසේ නම් අවබෝධ වේද යන්න ද අප ඉදිරියේ පවතින ගැටලු සහගත තත්වයකි. තෝමස් ජෙෆර්සන් මහතා පවසා ඇත්තේ, "මට පොත් නැතිව ජීවත් විය නොහැකිය." යනුවෙනි. ලෝකයේ බොහෝ වියතුන්, ප්‍රඥායන්, ප්‍රභූවරුන් මෙන්ම සිය ජීවිතය පුරාම මහඟු මෙහෙවරක් කළ විවිධ පුද්ගලයන් පොතපත කියවීම පිළිබඳව මෙවන් අගනා අදහස් ඉදිරිපත් කර ඇත. විල් රොජර්ස් නමැත්තා මෙවැනි අදහසක් පළ කර ඇත. " මිනිසා ඉගෙන ගන්නේ මාර්ග දෙකකිනි. එකක් නම්, කියවීමෙනි. අනික උසස්, වැදගත් පුද්ගලයන් ඇසුරු කිරීමෙනි." යනුවෙන් ඔහු කියවීමේ අගයට මුල් තැන දී සිය අදහස් පවසා ඇත. රිචඩ් ස්ටීල් නමැත්තා පවසනුයේ, "සිරුරට ව්‍යායාමය මෙන් මනසට කියවීම ද අවශ්‍ය වන" බවයි. මේ අතර ලොව ප්‍රකට ෆ්‍රැන්සිස් බේකන් සඳහන් කරන්නේ " ඇතැම් පොත් රස බැලීම සඳහාය. ඇතැම් ඒවා ගිලගැනීම සඳහාය. සුලු සංඛ්‍යාවක් වන ඇතැම් පොත් හොඳින් සපමින් ජීර්ණය කරගැනීම සඳහාය." යනුවෙනි. එයින් හැඟෙනුයේ පොත් අතර යන්තම් කියවා බැලිය යුතු ඒවාත්, තරමක් ධාරණය කරගත හැකි ඒවාත් ඇති අතර සැබෑ වටිනා පොත් හරියට රසැති, ගුණැති ආහාරයක් හොඳට සපා කමින්, අනුභව කොට ජීර්ණය කරගැනීමට, එමගින් පෝෂණයක් ලැබීමට සුදුසු වන්නා සේ අතිශය වැඩදායී ඒවා බවයි. බේකන් එමගින් පවසනුයේ පොත් කියවීම අප කළ යුතුම දෙයක් වන අතර පොත්වලින් අපට අත් වන ප්‍රයෝජන තුන් ආකාර වන බවය.

රැල්ෆ් වොල්ඩෝ එමර්සන් වූ කලී පරිසරයට ද ඉතා ලැදි වූ ශ්‍රේෂ්ඨ ලේඛකයෙකි, මහා ප්‍රාඥයෙකි. ඔහු පොත් ගැන පවසන ආකාරය මෙසේය. "විශේෂ දැනුමක් හා දක්ෂතාවක් ඇත්තකු අපට හමු වුවහොත් අප ඔහුගෙන් ඇසිය යුතු වැදගත්ම ප්‍රශ්නය වන්නේ ඔහු කියවන්නේ කවර පොත් ද කියාය." මෙයින් එමර්සන් අපට ඉඟි කරන දේ නොපැහැදිලි නොවේ. ශ්‍රේෂ්ඨ පුද්ගලයකු සැබවින්ම එම තත්වයට පත් වන්නේ හොඳ පොත් කියවීමෙන් බව මෙහිදී අපට පහසුවෙන් හැඟී යන්නකි. එසේ නම් කියවීම අත්‍යවශ්‍ය වූවක් වන්නා සේම, කෙනකු උසස් පුද්ගලයකු බවට පත් වීමට ද එය ඉමහත් සේ ප්‍රයෝජනවත් වන බව අමුතුවෙන් කිව යුතු නොවේ. එමෙන්ම, දැනුම, ඥානය හා අවබෝධය අතින් කෙනකු ශ්‍රේෂ්ඨත්වයට පත් වීමට හොඳ පොත් කියවීම අවශ්‍ය වන බව ද මෙයින් පළ වන තවත් අරුතකි.

පොත් පිළිබඳව මෙන්ම කියවීම පිළිබඳව ද ලොව පතළ ශ්‍රේෂ්ඨ පුද්ගලයන් පළ කළ කියමන් අතර අපට හමු වන තවත් වැදගත් පාඨයක් නම්, "පොත් වූ කලී අපේ නිහඬතම වූත්, ස්ථාවර වූත් මිතුරන් වැනිය." යන්නයි. ඒවා පහසුවෙන් හමුවිය හැකි, නුවණැති උපදේශනයක් ලබා දෙන, එමෙන්ම උපරිම ඉවසීමකින් යුත් ගුරුවරු වැනිය. පොත් කියවීමෙන් අපට ලැබෙන, අපට ලබාගත හැකි බොහෝ දෑ චාලිස් ඩබ්. එලියට්ගේ උක්ත කියමනෙන් පළ වෙයි. කල්‍යාණ මිත්‍රයකු හැම විටම අපට හිතවත් මෙන්ම අප සමග, සමීපව රැඳෙන්නකු බව කිව හැකිය. පොත් වූ කලී සදාතනිකවම අපට යහපතක් ඉටු කරන නිහඬ මිතුරන් බඳු බව ද මෙයින් පැහැදිලි වෙයි. පොත් මගින් අපට අවශ්‍ය යහපත්, සාධනීය උපදෙස් සමග උපදේශනයක් ද ලබාගත හැකිය. ජීවිතයේ අප මුහුණ දෙන ගැටලු සහිත අවස්ථාවකදී පොත් කියවීම මගින් අපට අවශ්‍ය විසඳුම කෙළින්ම හෝ වක්‍රව හෝ ලබා දෙනු ඇත.

අප තනන නිවසක කාමර කිසි විටෙකත් කවුළුවලින් තොර නොවනු ඇත. හයින්රික් මන් පවසන අන්දමට "පොත්වලින් තොර නිවසක් හරියට කවුළු රහිත කාමරයක් බඳුය." කාමරයකට ආලෝකය, වාතාශ්‍රය, බාහිර දර්ශන ආදිය අත්‍යවශ්‍ය වන්නා සේම අපගේ මනසට හා ජීවිතයට ද පොත් අත්‍යවශ්‍ය වනු ඇත. මාග්‍රට් ෆුලර් මේ ආකාරයේ, වඩාත් සිත්ගන්නාසුලු කියමනක් පොත් පිළිබඳව පවසා ඇත. "අද පොත් කියවන්නා හෙට නායකයෙකි." යනු ඇයගේ ප්‍රකාශයේ වැදගත් අරුතයි. මේ අතර අප හැමට හුරු පුරුදු වන, "කියවීම මිනිසා සම්පූර්ණ මිනිසකු කරයි." යන්න ද කියවීමේ අගය හා පොතපතේ අගය ගැන සිහි කරන විට අපගේ මතකයට නැගෙන ප්‍රධාන අදහසකි.

"කියවීම මිනිසා සම්පූර්ණ මිනිසකු කරයි." යන උක්ත කියමන වර්තමානයට කොතරම් දුරට හා කෙසේ අදාළ වන්නේද යන්න ගැනත් අපගේ අවධානය යොමු විය යුතුව ඇත. භාවිතයට අනුව යම් යම් අයහපත් ප්‍රතිඵල සමාජයට උදා කර දෙන නමුත් වත්මන් ලෝකයේ සිදු වී ඇති තාක්ෂණික දියුණුව, පරිගණකය ලබා ඇති තැන ආදිය ගැන සලකන විට පොත් කියවීමෙන් පමණක් කෙනකු සර්වසම්පූර්ණ දැනුමක් ලබන බවම කිව නොහැකිය. අද සාක්ෂරතා මට්ටම ගැන සඳහන් කරන විට හුදෙක් අකුරු ලිවීමේ හා කියවීමේ හැකියාවට අමතරව පරිගණක ඥානය ද ඇතැම් විට ඊට එක් කරගනු ලැබෙයි. ඒ අද පරිගණකය සමාජයේ ප්‍රමුඛ ස්ථානයක් ගෙන ඇති නිසයි. කෙසේ නමුදු මිනිස් මනසට තාක්ෂණය මෙන්ම ඊට අමතරව සංවේදී බව, ළඟා කර දීමට නම් පොත් කියවීමේ අවශ්‍යතාව ද සැලකිය යුත්තකි.

වාසනාවට මෙන් අද, ලියවෙන ඇතැම් පොත්, 'ඊ බුක්' ලෙස අන්තර් ජාලයෙන් 'ද බුක් හබ්' වැනි වෙබ් අඩවි ඔස්සේ කියවාගත හැකි වන සේ පහසුකම් සැලසී ඇත. පොත් සාප්පුවකට ගොස් මුදල් ගෙවා පොතක් මිල දී ගෙනවුත් කියවීම හැරුණ විට පරිගණකය මගින් ඊට වඩා අඩු මුදලක් ගෙවා එම පොත් කියවීම ඉටු කරගැනීමේ පහසුකම ද අද උදා වී ඇත. කරුණු මෙසේ වුවද, කඩදාසිය මත මුද්‍රිත අකුරෙන් කියවිය හැකි පොත්, තාක්ෂණික දියුණුවේ ජයග්‍රහණය විසින් නොවැදගත් තත්වයකට පත් කරනු ලැබේද යන භීතිය කෙනකුට ඇති වන්නට හොඳටම ඉඩ ඇත. එහෙත් කාලාන්තරයක් තිස්සේ පොත පත ලියාගෙන එන ලේඛක ලේඛිකාවන්ටත්, ඒවා කියවන හා රස විඳින පාඨක, රසික පිරිසටත් අවබෝධ විය යුතු වැදගත් කරුණක් නම්, පොත්

25 වන පිටට

